පේරාදෙණිය විශ්වවිද්‍යාලය
UNIVERSITY OF PERADENIYA

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2018 (අගෝස්තු 2018)
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – 2018( August 2018 )

**19වන සියවස තෙක් සිංහල සාහිත්‍යය සහ නාට්‍යය**

**(Sinhala Literature and Drama up to the 19th Century)**

**SINE (102)**

**කාලය පැය තුනයි (03).**

**පළමුවන ප්‍රශ්නය** හා **හතරවැනි ප්‍රශ්නය ඇතුළත්ව,** ප්‍රශ්න පත්‍රයේ ඇති කොටස් දෙකෙන් සෑම කොටසකින්ම **ප්‍රශ්න දෙකක්වත්** ඇතුළත්වන සේ ප්‍රශ්න **පහකට (05)** පිළිතුරු සපයන්න.
මෙහි අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව (08) අටකි. නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපනු ලැබේ.

---

## I කොටස

1. (අ) පහත සඳහන් ගද්‍ය පාඨය ලිහිල් බසින් ලියන්න.

> රෑ වැසි වැසලා අචිරවතී නම් ගඟ දණ පමණ තනමතු පමණ වතුරු සන්නා දැක තමන් මහඳබුඩි හෙයින් සිතාගතනොහී දරුවන් දෙන්නාම බර නොවතත් වඩාගෙන එකවිටම ගෙනයන්ට නැතිව ජීවත්වන්ට උන්ගේ දෛව නැති හෙයින් වැඩිමාලු පුතණුවන් මෙතෙර සිටුවාලා බාල දරුවන් වඩාගෙන එතෙරට ගොසින් කොළඅතු බිඳ ලාලා ඒ දරුවන් ඊමැද හොවාලා මෙතෙර සිටි දරුවන් කැඳවා එම් කියාත් සිතාත් බාල දරුවන් හැරපියා යත් නොහී ගොසිනුත් බලා සිටත් බලා මෙතෙර දරුවන් ළඟට යන්ට නික්මුණුවුය. ඉක්බිත්තෙන් දෙදරුවන්ටම තුදුරුව ගඟ මැදට ගිය කලට එක් උකුස්සෙක් ලේමස් ගඩුවක්සේ අතුමත්තේ හොත් දරුවන් දැක මස්වැදැල්ලෙකැයි සිතා අහසින් බට. සිටු දුවණියෝත් පුතණුවන් [3]ගසාගන්ට බස්නා උකුස්සා දැක [4]අත් ලෙන් අත්ල ගසා අරගල කළහ. උකුස්සාත් අරගල අසාගත නොහී අලුත උපන් කුමාරයන් ගෙනගත. ඔබින් දරුවෝත් නැත. මෙතෙර සිටි කුමාරයෝ මෑණියන් ගඟ මැද සිට අත ඔසවාලා අර ගල කළා දැක අසා තමන් කැඳවති යන්නක් නම්බලයෙන් සිතා ගෙන මෑණියන් එනතුරුත් නොරඳා වහා දියට බටවුය. බැසත් තමන්ට දිය බොහෝ හෙයින් වතුරේ ගියහ. එලෙසින් මෙගොඩ සිටි පුතණුවෝත් නැත.

(සද්ධර්මරත්නාවලිය, ඩී. බී. ජයතිලක සංස්: 541 පිට)

(ආ) "සද්ධර්මරත්නාවලී කතුවරයා, තමාට ආවේණික වර්ණනා මාර්ගයක යමින් ශ්‍රී ලාංකේය ගැමි ජීවිතය ඇසුරින් ධර්ම න්‍යාය පැහැදිලි කරයි " විමසන්න.

(අනෙක් පිට බලන්න)

2. "**ධර්ම ප්‍රදීපිකා කතුවරයා** සිය ආඛ්‍යානයේදී අරමුණු කරන ප්‍රස්තුතය අනුව තෝරා ගන්නා තත්සම, තත්භව හා නිර්මාණාත්මක අමිශ්‍ර සිංහල බස් වහර මැනවින් හසුරුවයි " මෙම කියමන නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

3. (අ) පහත දැක්වෙන ගද්‍ය පාඨය ලිහිල් බසින් ලියන්න.

> මන්තාණි නම් බැමිණී ගබ් ගෙනැ රැ[3] පුතකු ප්‍රසව[4] කළා. ඔහු මවු කුසින් නික්මෙන කලැ සියලු නුවරැ ආයුධ[5] දිලිණ. රජුගෙ යහන්හි තුබූ මඟුල්කඩුව ද, සෙසු ඇවි දූ[6] දිලිණ. බමුණු නික්මැ නකත්තරු බලන්නෙ සොරනකතින් උපන් බව් දනැ[7] රජු කරා ගොස් "දවස් ගිය සෙ සුව දැ?" යි පිළිවිත රජ "දවස් ගිය සෙ නොසුව යැ. රැ මා ගෙ මඟුල් ඇවි[8] දිලිණ. රජයට හො දිවියට[9] නො අනතරාය වෙසි යන ඇතින් නිදි නො ලත්මි" කි යැ. "මහරජ, නො බව.[10] මා ගෙ ගෙහි කුමරෙක් උපනි. උහු ගෙ අනුභාවයෙන් තොප ගෙ මතු නො වෙයි, සියලු නුවරැ ආයුධ දිලිණැ" යි කි යැ. රජ එ කල්හි "කිමෙක් වෙ?" යි පුළුවුත්තෙන්[11] "සොරෙක් වෙ" යි කි යැ. "එක සොරෙක් වෙයි හො? බොහො සොරුන් ගෙනැ රට පහරනට නිසි සොරෙක් වෙයි හො?" යි කි යැ. "එක සොරෙක් වෙයි, මහරජ" යි කි යැ. එසෙ කියා තමා රජු සිත් ගන්නා සඳහා "උහු හැරැ-පියුව[12] මැනැවැ හො?" යි කි යැ. "එක සොරකු බැවින් කුම්[13] කෙරෙයි! පිළිදඟුව උහු[14] යැ" යි කී යැ.

( අමාවතුර කෝදාගොඩ ඥානාලෝක සංස්: 130 පිට)

(ආ) "අමාවතුර රචනා කර ඇත්තේ, පාලි සංස්කෘත නොදත් නමුදු සිංහල බස හොඳින් දත් බුද්ධිමත් පාඨක පිරිසකටය" යන අදහසට පක්ෂව හෝ විපක්ෂව සනිදර්ශනව කරුණු දක්වන්න.

4. (අ) පහත දැක්වෙන සීගිරි ගී ලිහිල් බසින් ලියන්න.

28. (1) (සවසති)

මුතිරද්හු සැරැහු මුනැලින්ද් සිහිගිරි නම්
පව් සිරිබර් තිල බුසු මත
-ග-(2)-න්නි දුව්වන් මෙන්

30. දළ(සිවම් මෙ) හි(ය) ලීමි.

සරග මිල පළත හලළග මලබර (ව)රල
මහනෙල සපුකුසුමක අතිනි ගත
හෙළිලඹුයුක

31. (1) සවසති

(මෙ)හි බලත හිමබියො වේත කා
විසියො දත දෙණෙ

රනවන මෙ සෙ කිවි සිත නො
බැලියො දූ කොට ඇ(ස්) තද

(සීගිරි ගී, නන්දසේන මුදියන්සේ සංස්: 28,30, 31 ගී)

(අනෙක් පිට බලන්න)

(ආ) "සීගිරි ගී යනු භාෂා හරඹයකට වඩා, කවීන්ගේ පෞද්ගලික කාව්‍යමය අනුභූතීන් සඳහා පසුතල සැපයූ භාවගීතාවලියකි" (Lyric) මේ පිළිබඳ ඔබේ අදහස දක්වන්න.

## I I කොටස

5. (අ) පහත දැක්වෙන ගී ලිහිල් බසින් ලියන්න.

457

හමළ පොලෑ[1] සරා[2] සරා සිසි සොට් ඉසිලි[3]
සිලි[4] ගිරිඟනි මියුරු මියුරු සර ලී ගස් කැන්[5]

458

මොණරඹල පිල් නිල්[1] මහනෙල් කැන් බලාටැල
මලිගියමල්දම් හළ දූසකත් යත් ගනපියා

459

ලියමල්කැනට රැසි[1] සැදූ නහ ලොදරෙදෙන්[3]
නිකම්[4] දිගුවිලෑ සිඟයා ලියහඟ[5] වී විලැසියෝ[6]

460

මීගඳ ගඹ ජවන් හෙත හත්වන වෙනෙන් පුල්
මිතැත් කොපොලත්නි[1] තෙමී මමන ගළ මීනි තෙමී

(කව්සිළුමිණ, ඇම්. බී. ආරියපාල සංස්: 457-460 ගී)

(ආ) ඖචිත්‍ය ගුණයෙන් අනූන භාෂා භාවිතය, උපමා යෝජනය සහ අලංකාර භාවිතය කෙරෙහි අවධානය යොමු කරමින්, කව්සිළුමිණෙහි එන ඔබට අභිමත වර්ණනාවක් පිළිබඳ විවරණයක් සපයන්න.

6. "වීදාගම මෛත්‍රිය හිමි, බුදුගුණ අලංකාරය මගින් පවත්නා සම්ප්‍රදාය දෙස විවේචනාත්මකව බැලූ අතර වෑත්තෑවේ හිමියෝ ගුත්තිල කාව්‍යයේදී ගුරු සිසු සදාචාරයේ පරමාදර්ශය ස්ථාපනයට පෙළඹුණාහ" උක්ත ග්‍රන්ථ දෙකද ඇසුරු කර ගනිමන් සමකාලීන සමාජයෙහි පැවති ආකල්පමය විවිධතා පද්‍ය ග්‍රන්ථයන්හි නිරූපණය වන ආකාරය පිළිබඳ සමාලෝචනයක් කරන්න.

7. මයුර සංදේශයෙහි ගැබ් වූ ඔබට අභිමත වර්ණනයක් පිළිබඳ සෞන්දර්යාවලෝකනයක් කරන්න.

8. රෝග ව්‍යුපසමනයේදී රට යකුම හෝ සොකරි යන ගැමි ශාන්තිකර්ම දෙකෙන් එකක ගැබ් වූ මනෝ විද්‍යාත්මක ලක්ෂණ සමාලෝචනය කරන්න.

(සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගිනි.)